**මධ්‍යම සංස්කෘතික අරමුදල - 2013**

**--------------------------------------**

මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල් පනතේ 9 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මධ්‍යම සංස්කෘතික අරමුදල් පනතේ 9(4) වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 **විගණකගේ වගකීම**

**-------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යාන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

02. **මූල්‍ය ප්‍රකාශන**

**-------------**

2.1 **තත්ත්වාගණනය කළ මතය**

**---------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට මධ්‍යම සංස්කෘතික අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**-----------------------------------**

2.2.1 **සම්බන්ධිත පාර්ශවයන් සමඟ ඇති ගනුදෙනු හෙළිදරව් නොකිරීම**

---------------------------------------------------------------------------

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති පුද්ගලික සමාගමක් වූ සී/ස.සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් සමාගම, අරමුදලේ ඉදිකිරීම් හා සංරක්ෂණ කටයුතු කොන්ත්‍රාත් පදනම මත ඉටුකරනු ලබන අතර සමාලෝචිත වර්ෂය තුළ කොන්ත්‍රාත් පදනම මත ලබාගත් කම්කරුවන් සඳහා රු. මිලියන 114.8 ක් සමාගමට ගෙවා තිබුණි. මෙකී සමාගමේ එකම ආදායම අරමුදලින් කරනු ලබන ගෙවීම් පමණක් වන අතර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලට අරමුදලේ අධ්‍යක්ෂවරු දෙදෙනෙකුද, අරමුදලේ ගණකාධිකාරීවරයෙකු සමාගමේ ගණකාධිකාරී ලෙසද කටයුතු කරනු ලබයි. මධ්‍යම සංස්කෘතික අරමුදල හා සංස්කෘතික සංරක්ෂණ ඉදිකිරීම් පුද්ගලික සමාගම අතර පවතින මෙම සම්බන්ධතාවයේ ස්වභාවය සහ ගණුදෙනු පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

2.2.2 **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**--------------------**

අඩමාණ ණය වෙන්කිරීම් සම්බන්ධව අරමුදල විසින් අනුගමනය කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. ණය අයකර ගැනීමේ හැකියාව සමාලෝචනය කිරීමකින් තොරව ඉකුත් වර්ෂයේ අඩමාණ ණය ලෙස වෙන්කළ මුදලට සමාන මුදලක් එනම් රු.1,964,833 ක් සමාලෝචිත වර්ෂයේද අඩමාණ ණය ලෙස වෙන් කර තිබුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති පිරිවැය රු. 106,469,071 ක් වූ ලී බඩු, සවිකිරීම් සහ උපකරණ හා පිරිවැය රු.3,509,828 ක් වූ ගොඩනැගිලිවලින් භාවිතයට ගතහැකි වත්කම් හඳුනාගෙන එම වත්කම් වල සාධාරණ අගය නිශ්චය කර ගිණුම්ගත කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී වෙන්දේසි කර තිබුණ හා ප්‍රයෝජනයට ගත නොහැකිව විනාශ කර තිබුණු අබලි භාණ්ඩ ඒකක 6984 ක පිරිවැය හා සමුච්චිත ක්ෂය හඳුනාගෙන ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු වාහන 98 කින් සමාලෝචිත වර්ෂය අවසානයට වාහන 39 ක් පමණක් රු.20,940,000 කට ප්‍රත්‍යාගණනය කර තිබුණි. ප්‍රත්‍යාගණනය කරන ලද වාහන 5 ක ප්‍රත්‍යාගණිත වටිනාකම වූ රු.2,055,000 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි. පිරිවැය රු.14,252,724 වූ ඉතිරි වාහන 59 ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම විදේශ ආධාර ප්‍රදානයන් ලෙස 1984 සිට 2004 දක්වා කාලය තුළ අරමුදලට ලැබී තිබුණු වාහන 11ක් තක්සේරු කර ගිණුම්ගත කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.

(ඈ) අරමුදලේ ප්‍රධාන කාර්යාලය පිහිටි භූමියේ වටිනාකම රු. 4,064,443 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද එම භූමියේ හිමිකම අරමුදල සතු නොවූ හෙයින් අයිතිය සම්බන්ධව ඇති සීමාවන් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඉ) සුනාමි කෞතුකාගාරයක් ඉදිකිරීම සඳහා 2005 වර්ෂයේදී රු.2,558,000 කට මිලදීගෙන තිබුණු ගාල්ල නුගගහවත්ත ඉඩමෙහි වටිනාකම තක්සේරු කර ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි. මෙම ඉඩම සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය වෙත පැවරීමට නියමිත බව විගණනය වෙත දන්වා තිබුණද එලෙස පැවරීම සඳහා 2014 නොවැම්බර් 30 දින දක්වා පියවර ගෙන නොතිබුණි.

(ඊ) පසුගිය වසරේ ප්‍රත්‍යාගණනය කර තිබුණු ගොඩනැගිලිවලට අදාල ක්ෂය රු.1,050,000 ක් වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයට හර නොකර විදේශ සම්පත් අරමුදලට හර කර තිබීම හේතුවෙන් විදේශ සම්පත් අරමුදලේ ශේෂය එම වටිනාකමින් අඩුවෙන්ද වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය එම වටිනාකමින් වැඩියෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා වැයකර තිබූ රු.3,426,261ක මුදල අරමුදලේ ප්‍රචාරණ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඌ) සංචාරක ප්‍රවේශපත් මුද්‍රණය සඳහා වැය කර තිබූ රු.4,189,480 ක මුදල මුද්‍රණ ද්‍රව්‍ය මිලදී ගැනීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(එ) භාවිතයෙන් ඉවත්කර විකුණා තිබුණු පිරිවැය රු.728,050 ක් වූ වත්කම්වල අගය සහ සමුච්චිත ක්ෂය ගිණුම් වලින් ඉවත් නොකර වෙන්දේසියෙන් ලැබී තිබූ රු.99,650 පමණක් ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේදී පිරිවැය රු.4,280,060 ක්වූ අනුරූ නිමැවුම් හා නිෂ්පාදන ද්‍රව්‍යද, පිරිවැය රු.331,049 ක්වූ ප්‍රකාශන තොගද පරිත්‍යාග වශයෙන් ලබාදී තිබූ අතර පරිත්‍යාග ලෙස රු.331,049 ක් ගිණුම්ගතකර තිබූ නමුත් රු.1,226,680 ක් ප්‍රචාරන වියදම් ලෙසද, රු. 3,053,380 ක් අනෙකුත් සංස්කෘතික ක්‍රියාකාරකම් ලෙසද ගිණුම්ගත කර තිබුණි. අනුරූ නිෂ්පාදන හා ප්‍රකාශන අළෙවි ලාභය ගණනය කිරීමේදී මෙම පරිත්‍යාග විකුණුම් පිරිවැය අඩුකර දක්වනු වෙනුවට විකුණුම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඔ) විගණන නියැදි පරීක්ෂණය අනුව, ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් පාරිතෝෂික සඳහා වෙන්කිරීම් රු. 5,680,221 ක් වැඩිපුර ගිණුම්ගත කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ඕ) විදේශීයව පැවැත්වූ වෙළඳ ප්‍රදර්ශනයක් සඳහා ඉදිරිපත් කළ සහ විශේෂිත පුද්ගලයන් වෙත පරිත්‍යාග කිරීමට රැගෙන ගිය විකුණුම් මිල පිළිවෙලින් රු.314,365 හා රු.109,720 වූ අනුරූ නිෂ්පාදන සහ ප්‍රකාශන පිළිබඳව කිසිදු ගැලපීමක් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි.

(ක) ස්ථාවර තැන්පතු 7ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු පොළී ආදායම වූ රු.9,269,772ක මුදල ගිණුම්ගත කර නොතිබුණි.

2.2.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

------------------------------

පහත දැක්වෙන එක් එක් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොකෙරිණි.

| | විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| (අ ) | ජංගම වත්කම් - විවිධ ණයගැතියෝ | 420,817 | ණයගැති උපලේඛන |
| (ආ) | හිඟ හිටි සේවක ණය | 1,656,741 | වර්ෂ 5 කට වඩා පැරණි උත්සව හා විශේෂ අත්තිකාරම් සහ ආපදා ණය ශේෂ පිළිබඳ විස්තරාත්මක තොරතුරු |
| (ඇ) | පොළොන්නරුව පූජා භූමියේ අභ්‍යන්තර මාර්ගය සංවර්ධනය කිරීම | 29,235,510 | පිරිවැය ඇස්තමේන්තු, ඉංජිනේරු සහතික, කළවැඩ වාර්තා හා ගෙවීම් බිල්පත්, සිදුකළ අතිරේක වැඩ නිර්දේශ කිරීම් හා අනුමැතිය පිළිබඳ විස්තර |
| (ඉ) | විශේෂ අරමුදල් ව්‍යාපෘති 10ක් | 8,803,143 | එක් එක් අරමුදලට අදාල විස්තරාත්මක ලිපිගොනු හා උපයෝගී ලියවිලි |
| (ඊ) | විදේශ අරමුදල් ව්‍යාපෘති 03ක් | 1,969,612 | - එම - |

**2.3** **ලැබිය යුතු ගිණුම්**

------------------

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ ) ස්ථිර සේවකයින් 21 දෙනෙකුගෙන් අයවිය යුතු වසර 5 කට වඩා පැරණි රු.316,171 ක ආපදා ණය, ස්ථිර කාර්ය මණ්ඩලයේ නොවන කම්කරු සේවකයින්ගෙන් අයවිය යුතු වසර 6 කට වඩා පැරණි රු.366,721 ක ආපදා ණය හා වර්ෂ 5කට වඩා පැරණි අයකරගත යුතු රු.1,290,020ක් වූ උත්සව හා විශේෂ අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද අයනොවී පැවතුණි.

(ආ) වර්ෂ 5 කට වැඩි කාලයක සිට අය නොවී පවතින එකතුව රු.914,785ක් වූ ණයගැති ශේෂ 15ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2008 වර්ෂයට අදාල රු.264,670 ක්වූ නොපියවූ අග්‍රිම ශේෂයක්ද, සීගිරිය ව්‍යාපෘති කාර්යාලය විසින් විවිධ ආයතන වෙත 1993 – 2000 කාලයේදී ලබාදී තිබුණු රු.333,373 ක අත්තිකාරම් හා වර්ෂ 7 කට වැඩි කාලයක සිට පවතින උසාවි තැන්පතු රු.44,534 ක්ද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර නොතිබුණි.

## 2.4 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය : | |
| | VII පරිච්ඡේදයේ 12.2.6 වගන්තිය | |
| (i) | | වැඩ බැලීමේ වැටුප් ගෙවීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ පූර්ව අනුමැතිය ලබාගතයුතු වුවත්, නිලධාරීන් 74 දෙනෙකුට සමාලෝචිත වර්ෂය තුළ අනුමැතියකින් තොරව රු.2,187,644 ක් ගෙවා තිබුණි. |
| (ii) | XXXIII පරිච්ඡේදයේ 5 සහ 6 වගන්ති | අරමුදලේ නිලධාරීන් වග උත්තරකරුවන් කරමින් මධ්‍යම සංස්කෘතික අරමුදලට එරෙහිව බාහිර පාර්ශවයක් පවරා තිබූ නඩුවකදී අරමුදල වෙනුවෙන් කටයුතු කිරීමට නීතිපති විසින් භාරගෙන තිබියදීත්, ඉන් බැහැරව නීතිපති අනුමැතියකින් තොරව බාහිර නීතිඥවරුන්ගේ සේවය ලබා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.440,000 ක් ගෙවා තිබුණි. |
| (iii) | XLVIII පරිච්ඡේදයේ 22.1 උපවගන්තියට සංශෝධිත 2004 දෙසැම්බර් 15 දිනැති අංක 6/2004 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ II ඡේදය | 2009 වර්ෂයේදී වැඩ තහනමට ලක්වූ නිලධාරියෙකු සම්බන්ධ විනය පරීක්ෂණ සිදු කිරීමේදී කඩිනමින් පරීක්ෂණ කටයුතු සිදුකර නොතිබීම නිසා නිලධාරියාගෙන් අයකර ගත යුතුව පැවති දේපල ණය රු.407,719ක් සමාලෝචිත වර්ෂය අවසානය තෙක් අයකර ගත නොහැකිව තිබුණි. |
| (ආ) | 1983 අංක 12 දරන සේවක පාරිතෝෂික පනත | මෙම පනතේ විධිවිධාන වලට පටහැනිව සය මාසික ප්‍රායෝගික පුහුණුවන්නන් 158 ක් වෙනුවෙන් රු.1,952,529 ක් පාරිතෝෂික වෙන් කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2010 ඔක්තෝබර් 11 දිනැති අංක.මු.ක්‍ර.අ.01/2010/01 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 6.1 ඡේදය හා 9 (II) ඡේදය | සංයුක්ත දීමනා සඳහා පැය 24ක පූර්ණ දිනගණන තහවුරු කරගැනීමට අදාළ ගුවන් ගමන් විස්තරය (ගුවන් ගමන් ප්‍රවේශපත්‍රයේ පිටපතක්) ඉදිරිපත් කර නොතිබූ අතර විදේශ ගමන් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.2,482,107 ක් ගෙවා තිබුණි. |
| (ඈ) | 2008 ජුනි 26 දිනැති අංක. 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 04 ඡේදය | අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිල වාහනය සඳහා අනුමත ඉන්ධන ප්‍රමාණය මාසයකට ලීටර් 170 ක් වුවද එයට අමතරව ඇනවුම් වශයෙන් රු.1,112,130 ක් වටිනා ඉන්ධන අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී ලබාගෙන තිබුණි. තවද වෙන්කළ වාහන හිමිකම නොමැති නිලධාරීන් 3දෙනෙකු වෙත අනුයුක්ත වාහන ලබාදී මසකට ඉන්ධන ලීටර් 120ක් බැගින් දීමනාවක් අනුමැතියකින් තොරව ලබාදී තිබුණි. එම නිලධාරීන්ගෙන් දෙදෙනෙකු වෙත ගෙවන ඉන්ධන දීමනාවට අමතරව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළිවෙලින් රු.263,784ක් හා රු.484,484ක් වටිනා අමතර ඉන්ධනද ලබාදී තිබුණි. |
| (ඉ) | 2004 අගෝස්තු 31 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 353(5) හි 2 ඡේද | කුළී පදනම මත ලබාගත් වෑන්රථ 3ක් සඳහා මාසික කුළිය රු.50,000, 45,000 හා 45,000 වශයෙන් චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව ගෙවා තිබුණි. වාහන සැපයුම්කරුවන් සමඟ කිසිදු ලිඛිත ගිවිසුමකටද එළඹ නොතිබුණි. |
| (ඊ) | 1978 දෙසැම්බර් 19 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 842 | රු. 540,536,673 ක වටිනාකම වූ ගොඩනැගිලි හා මාර්ග යටිතල ව්‍යුහයන් ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කිරීමේදී සම්මත වර්ගීකරණයක් ඇතිකිරීම, වත්කම් හඳුනාගැනීම, ගිණුම්ගතකිරීම හා ඒවායේ පාලනය පහසු කරවීම සඳහා යොදාගත හැකි පරිදි එම ලේඛනය පිළියෙල කර නොතිබුණි. |
| (උ) | 2006 ජනවාරි 25 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 හා 3.4 වගන්ති සහ එයට යොමුවූ ප්‍රසම්පාදන අත්පොතේ 2.14.1 වගන්තිය | වෙළඳපල මිල සැලැහුම් ක්‍රමය අනුව ලංසු කැඳවීමේ අවම කාල සීමාව දින 7 ක් වුවද අරමුදලේ සේවකයන් සඳහා ටීෂර්ට් 1200 ක් මිළදී ගැනීමේදී පළමු දිනයේදීම මිළ ගණන් ලබාගෙන තිබුණි. තවද ලංසුකරුවන් 5 කට නොඅඩු සංඛ්‍යාවකින් මිළ ගණන් කැඳවියයුතු වුවද ආයතන 3 කින් පමණක් මිළ කැඳවීම් කර තිබුණි. |

2.5 **ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

**-----------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කැණීම් හා සංරක්ෂණ කටයුතු සඳහා මෙන්ම කැණීම්වලදී හමුවන පුරාවස්තු ලඟ තබාගැනීම සඳහාද මධ්‍යම සංස්කෘතික අරමුදල පනත මඟින් බලය පවරා නොතිබූ නමුත් පුරාවිද්‍යා කැණීම් හා සංරක්ෂණ

කටයුතු සඳහා සෘජු ද්‍රව්‍ය හා සෘජු ශ්‍රමය යොදවා ගැනීම වෙනුවෙන් මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් සමාලෝචිත වර්ෂයේදී රු.434,518,000 ක් වැයකර තිබුණි.

(ආ) මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 7 වන වගන්තිය අනුව සංස්කෘතික කටයුතු විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා නිල බලයෙන්ම අරමුදලේ ප්‍රධාන පරිපාලන නිලධාරියා වේ. මෙම තනතුර වෙනුවෙන් දීමනාවක් ගෙවීම සඳහා පනත මඟින් ප්‍රතිපාදන සලසා නොතිබුණද අරමුදල විසින් ලේකම්වරයාගේ මාසික වැටුපෙන් 33 1/3 ක මාසික දීමනාවක් ගෙවා තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද මුළු මුදල රු.241,356 ක් විය. මේ සඳහා ආයතන සංග්‍රහය හා රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර ආයතන අධ්‍යක්ෂගේ හා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොතිබුණි.

## 03. මූල්‍ය සමාලෝචනය

---------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මෙහෙයුම් වලින් රු.302,069,092 ක අතිරික්තයක් වූ අතර ඉකුත් වර්ෂයේ ඊට අනුරූපී අතිරික්තය රු.227,294,733 ක සමඟ සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.74,774,359 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී, අරමුදලේ මෙහෙයුම් වියදම් රු.314,812,779 කින් වැඩිවී තිබුණද ඊට පටහැනිව සංචාරක ප්‍රවේශපත් අලෙවි ආදායම රු.399,664,799 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංචාරක ප්‍රවේශපත් අලෙවිය හා සම්බන්ධ එම ප්‍රවේශපත් මුද්‍රණ වියදම 2012 වර්ෂයේදී රු.56,299,899 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එය රු.4,189,480 ක්වූ හෙයින් ඉකුත් වර්ෂයට සාපේක්ෂව වියදම සියයට 92.56 කින් අඩුවී තිබුණි. 2012 වර්ෂයේ එම වියදම ඊට පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 2291 කින් වැඩිවී තිබූ අතර, සංචාරක ප්‍රවේශපතක් මුද්‍රණය සඳහා විධිමත් නිශ්චිත ක්‍රමවේදයක් හඳුන්වාදී නොතිබීම හේතුවෙන් එම වියදම් වාර්ෂිකව විශාල වශයෙන් උච්චාවචනය වී තිබුණි.

(ආ) මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයට අනුව අනෙකුත් සංස්කෘතික ක්‍රියාකාරකම් සඳහා සමාලෝචිත වර්ෂයේදී වැයකර තිබූ මුදල රු.62,345,256 ක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී එම වියදමෙහි වැඩිවීම රු.29,429,621 ක් හෙවත් සියයට 89 ක් විය. පන්සල් නවීකරණය කිරීම හා පෙරහැර සඳහා අනුග්‍රහ ආධාර ලබාදීමේදී ඒ සඳහා නිර්ණායකයන්, ප්‍රමුඛතා ලැයිස්තුවක් පිළියෙල නොකිරීම සහ අයවැය පාලනයක් නොවීම වැනි හේතු මෙකී වියදම් වැඩිවීම කෙරෙහි බලපා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී පාරිතෝෂික සඳහා වෙන් කිරීම රු.35,313,462 කින් වැඩිවීම පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 112 ක් විය. ගණනය කිරීමේ දෝෂ මෙසේ වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3.3 **ආයතනයට එරෙහිව ඇති නෛතික සිද්ධි**

-----------------------------------------------

ඇණවුම් ප්‍රකාරව කාර්යය ඉටුකර දී තිබුණද තමන් වෙත අයවිය යුතු රු.379,137 ක් නොගෙවීම සම්බන්ධයෙන් එම මුදල් අයකර ගැනීම සඳහා බාහිර සමාගමක් විසින් අරමුදලට එරෙහිව 2010 වර්ෂයේදී නඩු පවරා තිබුණි. තවද අරමුදලට අයත් වාහනයක් මඟින් සිදුවූ අනතුරක් නිසා වූ අලාභ වශයෙන් රු.500,000ක් වන්දි ඉල්ලා බාහිර පාර්ශවයක් විසින් 2004 වර්ෂයේදී අරමුදලට එරෙහිව නඩුවක් පවරා තිබුණි.

04. **මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

4.1 **කාර්ය සාධනය**

------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ ) ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කර ඇස්තමේන්තු සකසා තිබුණද ක්‍රියාත්මක නොවූ කාර්යයන්

---------------------------------------------------------------------------------------------------

(i) සමාලෝචිත වර්ෂයේදී නිම කිරීමේ අපේක්ෂාවෙන් ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කර ඇස්තමේන්තු සකසා තිබූ කැණීම් වැඩබිම් 11 ක ඇස්තමේන්තු පිරිවැය රු.6,973,555 ක්වූ වැඩ ඒකක 2305 ක්ද, සරක්ෂණ වැඩබිම් 18 ක ඇස්තමේන්තු පිරිවැය රු.34,502,306 ක්වූ වැඩ ඒකක 6175 ක්ද සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී නිම කිරීමට සැලසුම් කර තිබූ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.28,372,315ක් වූ සංරක්ෂණ කාර්යයන් 3ක් නිම කිරීමට නොහැකිවී තිබුණි.

(ආ) භෞතික හා මූල්‍ය කාර්යසාධනය ප්‍රමාණවත් නොවීම

-----------------------------------------------------------

ව්‍යාපෘති 7 ක වැඩබිම් 32 ක් සඳහා වැඩ ඒකක 25,271 ක් සමාලෝචිත වර්ෂයේදී නිම කිරීමට සැලසුම් කර රු.92,008,696 ක් ඇස්තමේන්තු කර තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට නිමකර තිබුණේ වැඩ ඒකක 7,216 ක් පමණි. ඒ සඳහා තථ්‍ය වියදම රු.18,543,083 ක් හෙයින් භෞතික හා මූල්‍ය කාර්යසාධනය සියයට 30 ට අඩු මට්ටමක පැවතුණි.

(ඇ) 2013 ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් නොවූ නමුත් ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘති

-------------------------------------------------------------------------------------

(i) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට (වැඩ සැලැස්ම) ඇතුළත් කර නොතිබූ කැණීම් හා සංරක්ෂණ වැඩබිම් 31 ක වැඩ ඒකක 15856 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.43,120,338 ක් ඇස්තමේන්තු කර එයින් වැඩ ඒකක 12886 ක් නිම කිරීම වෙනුවෙන් රු.30,253,179 ක් වැයකර තිබුණි.

(ii) පොළොන්නරුව ගල් විහාරයේ පියස්ස ඉදිකිරීම සඳහා වූ සංශෝධිත ඇස්තමේන්තුව රු.7,294,349 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට භෞතික කාර්යසාධනය සියයට 30 ක් පමණ විය.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ ) මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය වන සංචාරක ප්‍රවේශපත් අලෙවිය මඟින් සමාලෝචිත වර්ෂයේදී ලැබූ ආදායම රු.1,748,439,894 ක් විය. එසේ වුවද ප්‍රවේශපත්‍ර මුද්‍රණයේදී පැහැදිලි පිරිවිතර, ප්‍රමාණවත් ආරක්ෂිත ක්‍රමවේද හා තොග පාලනය සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වාදී නොතිබීම හේතුවෙන් ප්‍රවේශපත් මුද්‍රණයේ, තොග පවත්වාගෙනයාමේ හා අලෙවියේ අභ්‍යන්තර පාලන දුර්වලතා පැනනැගී තිබුණි. විද්‍යුත් රේඛන (Bar Code System) වැනි නවීන තාක්ෂණ ක්‍රමවේදයක් යොදා ගනිමින් එය සංවර්ධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අරමුදලේ 2013 – 2016 කාලය සඳහා සංයුක්ත සැලැස්ම සැකසීමේ කාර්යය රු.600,000 කට නිපුණතා සංවර්ධන අරමුදල වෙත පවරා තිබූ අතර 2012 ඔක්තෝබර් 10 දින එළඹි ගිවිසුමට අනුව එදින සිට සති 6 ක් ඇතුළත සංයුක්ත සැලැස්ම සකස් කර භාරදිය යුතු වුවද එය භාරදී තිබුණේ 2013 මැයි 13 දිනය. ප්‍රමාද ගාස්තු අඩුකර ගැනීම සඳහා ගිවිසුමෙහි කොන්දේසි ඇතුළත් නොකිරීම අරමුදලට අවාසිදායක වී තිබුණි.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

(අ ) පුරාවිද්‍යා කැණීම් සඳහා අනුමැතිය

--------------------------------------

(i) පුරාවස්තු ආඥා පනතේ 06 සහ 07 වගන්ති අනුව පුරාවිද්‍යා කැණීම් සිදුකිරීමට පෙර කැණීම් භූමිය පිළිබඳ සියළු තොරතුරු ඉදිරිපත් කර පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් බලපත්‍රයක් ලබාගත යුතු වුවද, අරමුදල විසින් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කැණීම් ව්‍යාපෘති 10 ක් වෙනුවෙන් වූ වැඩ සැලැස්ම පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය සඳහා යොමුකර තිබුණේ 2013 ජුනි 30 දිනදීය.

(ii) උක්ත ආඥා පනතේ 10 වගන්තිය අනුව කැණීම්වලදී සොයාගනු ලැබූ සියළු පුරාවස්තු පිළිබඳ වාර්තා මෙන්ම කැණීම් පිළිබඳ වාර්තාද පිළියෙල කර පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළයුතු වුවත් එසේ ඉදිරිපත් කර නොතිබුණි. තවද කැණීම් වලදී සොයාගනු ලබන විශේෂිත පුරාවස්තු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත භාරදිය යුතු වුවත් එවැනි භාරදීමක් සිදුකර නොතිබුණි.

(ආ) බාහිර පාර්ශවයන්ට ලබාදුන් ද්‍රව්‍ය

---------------------------------------

අභයගිරිය හා ආලාහන ව්‍යාපෘති මඟින් 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලය තුළ විවිධ අවස්ථාවලදී බාහිර පාර්ශවයන්ට ලබාදුන් GI බට 3040 ක් ද, කප්ලීන් 4493 ක්ද ආපසු ලබාගැනීමට 2014 ජුනි 31 දින තෙක් කටයුතු කර නොතිබුණි.

(ඇ) අපහරණය නොකළ වත්කම්

---------------------------------

2013 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය මඟින් අනාවරණය කරගෙන තිබූ පරිදි අරමුදල සතුව පවත්නා අබලන් වාහන 9 ක් හා යතුරුපැදි 2 ක් වර්ෂ 3 කට වැඩි කාලයක සිට අනාරක්ෂිතව ගාල්කර ඇති බවත් ඒවා වෙන්දේසි කිරීමට හෝ සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට 2014 ජූලි 31 දින තෙක් කටයුතු කර නොතිබූ බවත් නිරීක්ෂණය විය.

(ඈ) උපදේශකවරු බඳවා ගැනීම හා ඔවුන්ගේ සේවාව

-------------------------------------------------------

අරමුදලේ ව්‍යාපෘතිවල කටයුතු සඳහා සමාලෝචිත වර්ෂයේදී කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණු උපදේශක අධ්‍යක්ෂවරු හා වාස්තුවිද්‍යා උපදේශකවරු 14 දෙනෙකු සඳහා දීමනා ලෙස දළ වශයෙන් රු.2,396,824ක් ගෙවා තිබුණද ඔවුන් විසින් ඉටු කළ යුතු රාජකාරි හා තම වාර්තා ඉදිරිපත් කළ යුතු ආකාරය පිළිබඳ ඔවුන්ට පැහැදිළි උපදෙස් ලබාදී නොතිබුණි. මේ අනුව ස්ථිර මාසික දීමනාවක් හා ඉන්ධන දීමනාවක් ලබා ගනිමින් ඔවුන් කළ සේවාව කුමක්ද යන්න විගණනයට තහවුරු නොවුණි.

4.4 **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**----------------------------------**

(අ ) පොළොන්නරුව පූජා භූමියේ අභ්‍යන්තර මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම

--------------------------------------------------------------------------

පොළොන්නරුව පූජා භූමියේ පිටවීමේ දොරටුවේ සිට අභ්‍යන්තරයට මාර්ගය කි.මී. 01 ක් සිමෙන්ති බ්ලොක් ගල් අතුරා වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව මාර්ග සංවර්ධන අධිකාරිය වෙත රු.27,500,000 කට පවරා තිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසානයට මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබූ මුදල රු.29,235,510 ක් විය. මේ සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මූලික පිරිවැය ඇස්තමේන්තුවක් මෙන්ම පැහැදිළි පිරිවිතරයන්ද පිළියෙල කර ලබාදී නොතිබියදී අනුමැතියකින් තොරව පාරේ පළල මීටර් 4.5 සිට 6.2 දක්වා වැඩි කර තිබුණි. තවද ප්‍රමිතියෙන් බැහැර ඉදිකිරීම් හේතුවෙන් ඇස්තමේන්තුගත මුදල රු.48,575,893 ක් දක්වා ඉහළ ගොස් තිබූ අතර ඒ සඳහා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය හා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය ලබාගෙන නොතිබුණි.

(ii) මාර්ගයේ අතුරා තිබූ ගල් නියමිත ප්‍රමිතියට වඩා ශක්තියෙන් අඩු ඒවා වුවත් එම ගල් සඳහා අරමුදල විසින් රු.16,992,545 ක්වූ සම්පූර්ණ මුදල ගෙවා තිබුණි. තවද බිල්පත් සඳහා ගෙවීම් කිරීමට පෙර ඉදිකිරීම්වල තත්ත්ව පරීක්ෂාවක් සිදුකර නොතිබුණි.

(iii) ගිවිසුමට අනුව දින 90 කින් ඉදිකිරීම් නිම කළයුතු වුවද සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට දින 652 ඉක්මවා ගොස් තිබුණද කාර්ය නිමකර නොතිබුණි. කොන්ත්‍රාත් මිල සහ ප්‍රමාණ විචලනයන්, ප්‍රමාද ගාස්තු අයකිරීම හා ප්‍රමිතියෙන් බැහැර ඉදිකිරීම් පිළිබඳ ප්‍රතිපාදනයන් ගිවිසුමේ ඇතුළත් කර නොතිබීම අරමුදලට අවාසිදායක වී තිබුණි.

(ආ ) සී/ස. සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් සමාගමෙන් ශ්‍රමිකයින් ලබාගැනීම

----------------------------------------------------------------------------------------

අරමුදලේ ව්‍යාපෘතිවල සේවය සඳහා පුහුණු සංරක්ෂණ/ කැණීම් සහායකයින් කොන්ත්‍රාත් පදනම මත සපයා ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා සී/ස.සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් පෞද්ගලික සමාගම වෙත රු.114,879,000 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධ පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සමාගම පිහිටුවීමේ අමාත්‍ය මණ්ඩල සංදේශය හා ඒ සඳහා වූ අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව මධ්‍යම සංස්කෘතික අරමුදලේ සේවකයන් එම සමාගම මඟින් සේවයේ යොදවා ගැනීම හා ඔවුන්ගේ වැටුප් සමාගම මඟින් ගෙවීම අරමුණු කරගෙන තිබුණද එයට පටහැනිව සමාගමේ ශ්‍රමිකයින්ට අරමුදලින් ගෙවීම්කර තිබුණි.

(ii) ගිවිසුමේ 1 වන වගන්තිය අනුව ශ්‍රමිකයන් වයඹ සංස්කෘතික චතුරශ්‍රයේ ව්‍යාපෘතිවල කැණීම්/ සංරක්ෂණ සහායකයින් වශයෙන් සේවයේ යෙදවිය යුතු වුවද එයට පටහැනිව වෙනත් ව්‍යාපෘතිවල මෙන්ම ව්‍යාපෘති කාර්යාලවලද ඔවුන් සේවයේ යොදවා තිබුණි.

(iii) ගිවිසුම පරිදි ලබාගන්නා ශ්‍රමික මිනිස් දිනයක් සඳහා අරමුදල මඟින් එම සමාගමට රු.1,200 ක් ගෙවා තිබුණද සමාගම විසින් ශ්‍රමිකයන්ට දිනකට ගෙවා තිබූ මුදල රු.700 ක් පමණි. මේ අනුව 2013 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ලබාගත් මිනිස් දින 95,732 ක් වෙනුවෙන් එක් ශ්‍රමික දිනකින් රු.500 බැගින් වර්ෂය තුළදී රු.47,866,000 ක ලාභයක් උපයා ගැනීමට සමාගමට ඉඩ සලසා තිබුණි.

(iv) ව්‍යාපෘතිවල අවශ්‍යතාවය ඉක්මවා ශ්‍රමිකයින් සේවයේ යොදවා තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. උදාහරණයක් ලෙස පඬුවස්නුවර ව්‍යාපෘතියේ අතිරික්ත ශ්‍රමිකයින් වෙනුවෙන් රු.4,046,225 මුදලක්ද, රිදී විහාර ව්‍යාපෘතියේ රු.8,094,003 ක්ද අතිරික්තව ගෙවා තිබුණි.

(ඇ) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පත්වීම හා වැටුප් ගෙවීම

----------------------------------------------------------------

(i) 2012 ඔක්තෝබර් 03 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ තීරණයක් පරිදි වැඩ බැලීමේ පදනමින් පත්කර සිටින වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙනුවට ස්ථිර පදනමින් නිලධාරියකු මෙතෙක් පත්කර නොතිබුණි.

(ii) අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ වැඩ බැලීම වෙනුවෙන් වැඩ බැලීමේ වැටුපක් වෙනුවට පුරාවිද්‍යා මහාචාර්යවරයකු ලෙස නිත්‍ය තනතුරේ වැටුප අරමුදල මගින් ගෙවා තිබුණි. ඒ අනුව මාසිකව රු.162,706 බැගින් සමාලෝචිත වර්ෂය සඳහා වැටුප් ලෙස රු.1,952,468 ක් ගෙවා තිබුණි.

(ii) මෙම නිලධාරියාගේ නිත්‍ය තනතුරේ වැටුපට අයත් අධ්‍යාපනික දීමනා (Academic Allowance) සහ පර්යේෂණ දීමනා (Research Allowance) මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට අදාළ නොවූවද දිගින් දිගටම අරමුදලින් ලබාගෙන තිබෙන අතර වැටුපට ඇතුළත්ව 2013 වර්ෂය තුළදී ලබාගත් එම දීමනා එකතුව රු.824,003 ක් විය.

(ඇ) නීති නිලධාරි තනතුර සඳහා පත්කිරීම

------------------------------------------

(i) තරඟකාරී අයදුම්පත් කැඳවීමෙන් තොරව මධ්‍යම සංස්කෘතික අරමුදලේ නීති නිලධාරි තනතුර සඳහා 2013 ජූනි 01 දින සිට නව නිලධාරියකු කොන්ත්‍රාත් පදනම මත පත්කර තිබුණි. එම නිලධාරියාහට අනුමත බඳවා ගැනීම් පරිපාටිය අනුව පැවතිය යුතු සුදුසුකම් නොතිබුණද නීති නිලධාරී තනතුරට අදාළ වැටුප් කාණ්ඩයේ ආරම්භක වැටුප සමඟ රජයේ හා මධ්‍යම සංස්කෘතික අරමුදලේ අනුමත වෙනත් දීමනා ද ඇතුළත්ව 2014 මැයි 31 වන විට ගෙවා තිබූ මුළු වැටුප රු.422,786 ක් විය.

(ii) 2014 මැයි 31 දිනෙන් සේවා කාලය අවසන් වන හෙයින් අයදුම්පත් කැඳවා සුදුසු අයකු පත්කර ගන්නා තෙක් වසරක කාලයක් සඳහා පමණක් ඔහුගේ සේවය ලබාගැනීමට ලැබී තිබූ පාලක මණ්ඩල අනුමැතියට පටහැනිව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඔහුගේ සේවා කාලය තවත් වසර 02 ක් සඳහා දීර්ඝ කර පෙර පරිදිම වැටුප් ගෙවා තිබුණි.

(ඉ) වාහන මිලදීගැනීම

---------------------

අරමුදල සඳහා වාහන මිලදී ගැනීමේදී අනුමත වියදම් සීමාවන් පිළිබඳව ජාතික අයවැය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක.BD/NI 177/2/9/01/CCF හා 2011 මාර්තු 25 දිනැති ලිපිය අනුව අධ්‍යක්ෂ ජනරාල්වරයා සඳහා අනුමත සීමාව රු. මිලියන 4.5 ක් වුවද එම සීමාව ඉක්මවා රු. මිලියන 2.48 ක් සමාලෝචිත වර්ෂයේ වැය කර තිබුණි. තවද අධ්‍යක්ෂ (මුදල්) හා ක්‍රියාකාරී අධ්‍යක්ෂ සඳහා වාහන 2 ක් මිලදී ගැනීමට භාණ්ඩාගාර අනුමැතිය ලැබී නොතිබියදී ඒ සඳහා රු. මිලියන 15.8 ක් වැය කර තිබුණි.

(ඊ) පිරිවෙන්වල පුස්කොළ පොත් ලේඛන කලාව සංවර්ධනය කිරීම වෙනුවෙන් යාපහුව ව්‍යාපෘතිය වෙත පත්කරන ලද පරිවේනාචාර්යවරයෙකු හට මාසිකව රු.20,000 ක දීමනාවක් හා පෙට්‍රල් ලීටර් 100 බැගින් සමාලෝචිත වර්ෂය සඳහා ගෙවා තිබුණද පුස්කොළ පොත් ලේඛන කලාව ප්‍රවර්ධනය සඳහා ඔහු ඉටුකළ රාජකාරී මොනවාද යන්න විගණනයට නිරීක්ෂණය නොවුණි.

4.5 **දෘශ්‍ය අක්‍රමිකතා**

--------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ ) විදේශීය සංචාරක ප්‍රවේශපත් සමඟ නොමිලේ ලබාදීම සඳහා DVD සපයා ගැනීම

-------------------------------------------------------------------------------------------

විදේශීය සංචාරක ප්‍රවේශපත් සමඟ නොමිලේ ලබාදීම සඳහා සීගිරිය, පොළොන්නරුව හා අනුරාධපුර යන සිද්ධස්ථාන ඇතුළත් DVD ලක්ෂ 5 ක් නිෂ්පාදනය කර සපයා ගැනීම සඳහා රු.51,099,925 ක් වැයකර තිබුණි. මේ සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය විය.

(i) අදාල කොන්ත්‍රාත්කරු විසින් මීට පෙර නිෂ්පාදනය කරදී තිබුණු අනුරාධපුර, පොළොන්නරුව හා සීගිරිය ඇතුළත් වාර්තාමය චිත්‍රපටවල දර්ශන පරිගණක පිටපත් කිරීමක් තුළින් යලි සකසා නව නිර්මාණයක් ලෙසින් වංචාසහගත ලෙස මෙම DVD පට නිෂ්පාදනය කර තිබුණි.

(ii) DVD නිෂ්පාදනය සඳහා ඉදිරිපත් වූ අවම ලංසුව සාධාරණ හේතුවක් නොමැතිව නොසලකා හැර උපරිම ලංසුව තෝරා ගැනීම නිසා අරමුදලට රු.18,125,000 ක අලාභයක් සිදුවී තිබුණි.

(iii) මෙම කොන්ත්‍රාත්කරු විසින් මෙම විෂයගත කරුණ සම්බන්ධව මීට පෙර ලබාදුන් කොන්ත්‍රාතුවකට අදාල රු.4,701,000 ක ගිවිසුමක් කඩකර තිබියදී හා එම කාර්ය ඉටු කිරීමට පෙර ඔහු වෙත එකතුකළ අගය මත බදු (VAT) සමග සම්පූර්ණ මුදල වූ රු.5,191,150 ක් ගෙවීම පිළිබඳ ඉකුත් වර්ෂයේ විගණකාධිපති වාර්තාවේද කරුණු දක්වා තිබියදී එම කරුණු නොසලකා හැර තිබුණි.

(iv) ගිවිසුමට එළඹීමේදී ප්‍රමාද ගාස්තු හා එකතු කළ අගය මත බදු (VAT) ගෙවීම්වලට අදාළ කොන්දේසි කොන්ත්‍රාත්කරුට වාසිදායක වන ලෙස දක්වා තිබුණි. එසේම ලංසු සුරක්ෂණ සහ කාර්යසාධන සුරක්ෂණ පිළිවෙලින් රු.446,250 ක් හා රු.2,281,250 ක් වශයෙන් අඩුවෙන් ලබාගෙන තිබුණි.

(v) පිරිවැය ඇස්තමේන්තු සැකසීම, පිරිවිතර සැකසීම හා ඒ අනුව ලංසු ලේඛන සැකසීම විශේෂ ප්‍රාගුණ්‍ය ඇති උපදේශකයකු විසින් සිදුකර නොතිබූ අතර ප්‍රසම්පාදන ලියවිලි විශේෂඥ දැනුම් ඇති තාක්ෂණික ඇගයීම් කමිටුවක් විසින් අනුමත කළයුතු වුවද එසේ කර නොතිබුණි. තවද නිපදවා භාරදෙන ලද DVD සුදුසුකම් ලත් තාක්ෂණික ඇගයීම් කමිටුවක පරීක්ෂාවට ලක්කර නොතිබුණි.

(vi) කොන්ත්‍රාත්කරු එකතු කළ අගය මත බදු ගෙවීම සඳහා ව්‍යාජ බදු අංකයක් ඉන්වොයිස්පත්වල ඇතුළත් කර අරමුදල වෙතින් වංචා සහගතව වැට් බදු ලෙස රු.5,474,999ක් ලබාගෙන තිබුණි.

(ආ ) ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුර සඳහා පත්කිරීම හා දීමනා ගෙවීම

----------------------------------------------------------------------

මධ්‍යම සංස්කෘතික අරමුදලේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවන හා මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ සඳහන් නොවන ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුරක් සඳහා 2006 වර්ෂයේ ජනවාරි සිට නිලධාරියෙකු පත්කර එදින සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් දක්වා මාසික දීමනා ලෙස රු.4,494,105 ක් වූ දීමනා ගෙවා තිබුණි.

(i) අරමුදලේ නිත්‍ය කාර්ය මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකුට හිමි වැටුප් ක්‍රමයේ උපරිම වැටුප් තලයට එක් වැටුප් වර්ධකයක් අඩුවෙන් වන මාසික දීමනාවක් ඔහුට ගෙවා තිබූ අතර ඒ සඳහා 2009 මැයි 26 දිනැති අංක. 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොතිබුණි.

(ii) මෙම නිලධාරියා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ අධ්‍යක්ෂ ලෙස නිත්‍ය තනතුරකද රාජකාරි කරමින් එම ආයතනයෙන්ද සම්පූර්ණ වැටුප් හා දීමනා ලෙස ඉහත කාලසීමාව තුළ රු.5,076,836 ක් ලබාගෙන තිබුණි. තවද මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂවරයකුට හිමි සියලු වරප්‍රසාද මෙන්ම රාජ්‍ය සේවක වැටුප් වැඩිවීම්වලදී අරමුදලේ දීමනාවද ඒ අයුරින් වැඩි කරගෙන හිඟ මුදල්ද සමඟ ලබාගෙන තිබුණි.

(iii) 2006 සිට සමාලෝචිත වර්ෂය දක්වා මධ්‍යම සංස්කෘතික අරමුදලේ වෙන්කළ වාහන 2 ක් වරින් වර භාවිතා කර මාසිකව ලීටර් 120 බැගින් ඉන්ධන දීමනාව ලබාගෙන තිබුණි. උක්ත කාලය තුළ ලබාගත් ඉන්ධන දීමනාව රු.949,618 කි. එම කාලය සඳහා වෘත්තීය පුහුණු අධිකාරිය වෙතින්ද වෙන්කළ වාහනයක් හා මාසික ඉන්ධන දීමනාවක් ලබාගෙන තිබුණි.

(ඇ) බොරළු මිලදී ගැනීම - සීගිරිය ව්‍යාපෘතිය

----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සීගිරිය ව්‍යාපෘතියේ අභ්‍යන්තර මාර්ග අලුත්වැඩියාව වෙනුවෙන් 2013 වර්ෂයේදී රු.1,718,125ක බොරළු මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් මණ්ඩල අනුමැතියකින් තොරව ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන් වෙත මිල කැඳවීම් ලිපි යවා විනිවිදභාවයකින් තොරව සැපයුම්කරුවන් තෝරාගෙන තිබුණි.

(ii) ටෙන්ඩර් ලියවිලි ගාස්තු හා ලංසු සුරක්ෂණ ඉදිරිපත් කර නොතිබූ සැපයුම්කරුවන්ගේ ලංසුද ඇගයීමට භාජනය කර රු.718,125 ක් වටිනාකමැති ටෙන්ඩරයක් ලංසු සුරක්ෂණ ඉදිරිපත් කර නොතිබූ සැපයුම්කරුවකු වෙතද රු.500,000 ක ටෙන්ඩරයක් ටෙන්ඩර් ලියවිලි ගාස්තු ඉදිරිපත් කර නොතිබූ සැපයුම්කරුවකු වෙතද ප්‍රදානය කර තිබුණි.

(iii) මෙම මිලදී ගැනීමේදී, සමාලෝචිත වර්ෂයේ මාතලේ දිස්ත්‍රික් මිල කමිටු මිල ගණන් අනුව බොරළු කියුබ් 1 ක මිල රු.1,000 ක් වුවද කියුබ් 1 ක් රු.1,875 බැගින් බොරළු කියුබ් 383 ක්ද, කියුබ් 1 ක් රු.2,000 බැගින් කියුබ් 500 ක්ද මිලදීගෙන තිබුණි. ප්‍රදේශයේ පවතින මිල ගණන් ඉක්මවා බොරළු මිලදී ගැනීම හේතුවෙන් අරමුදලට රු.835,125 ක අලාභයක් සිදුවී තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේදී මිලදීගත් රු.253,950 ක් වටිනා බොරළු කියුබ් 135.44 කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වසර 1 ½ ක පමණ කාලයක් අනාරක්ෂිතව ගබඩා පරිශ්‍රය අසල

තැන්පත්කර තිබූ අතර ඒවා ටෙන්ඩර් පිරිවිතර වල සඳහන් ප්‍රමිතියට නොතිබූ බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඇ ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වාහන පරිහරණය

---------------------------------------------------------

(i) 2013 ජනවාරි සිට 2014 අගෝස්තු දක්වා කාලය සඳහා අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත අනුයුක්ත කර ඇති නිල රථයේ ධාවනය නොකළ කිලෝමීටර් 5929 ක් සඳහා ධාවනය කළ බවට ව්‍යාජ සටහන් තබමින් රු.137,214 ක් වටිනා ඉන්ධන ලීටර් 847 ක් වංචනික ලෙස ලබාගෙන තිබුණි. 2014 අගෝස්තු 22 දිනට වාහනයේ මයිලෝ මීටරය කි.මී.111,476 ක් වුවද ධාවන සටහන් පත්වල කි.මී.117,405 ක් ධාවනය කර ඇති බව දක්වා තිබුණි.

(ii) තවද ඉහත නිල රථය ඔහු විදේශගතව සිටි කාලය තුළ ධාවනයේ යොදවා ඔහුගේ භාර්යාවගේ පරිහරණයට ගෙන තිබුණි. එම කාලය තුළ කි.මී. 1795 ක් ධාවනයේ යොදවා ලීටර් 297 ක් ඉන්ධන භාවිතයට ගෙන තිබුණි.

4.6 **අරමුණට පටහැනි වියදම්**

**--------------------------**

අරමුදලේ අරමුණුවලට පටහැනි පහත සඳහන් වියදම් සමාලෝචිත වර්ෂයේදී වැයකර තිබුණි.

(අ ) ජනපති පදවි ප්‍රාප්තිය 2 වන සැමරුම වෙනුවෙන් සුභ පැතීම සඳහා පුවත්පත් දැන්වීම් ගාස්තු රු.351,000 ක් ගෙවීම.

(ආ) රාජකීය ආසියාතික සමිතිය නමින් වූ බාහිර පුද්ගලික ආයතනයක් විසින් සංවිධානය කළ ශාස්ත්‍රීය සම්මේලනය සඳහා අනුග්‍රාහක දීමනාවක් ලෙස අරමුදල විසින් රු.400,000 ක් ගෙවා තිබුණි.

4.7 **හඳුනාගන්නා ලද පාඩු**

-------------------------

කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව අත්තිකාරම් බැඳුම්කර හා කාර්යසාධන බැඳුම්කර අවලංගුවීමට ප්‍රථම අයකර ගතයුතු මුදල් අයකර ගැනීමට අරමුදල කටයුතු කර නොතිබීම හේතුවෙන් 2000 හා 2011 වර්ෂවලදී පුද්ගලික සමාගම් 2 කින් අයකර ගතයුතු රු.1,705,055 ක් එම වර්ෂවල සිට නොපියවන ලද අත්තිකාරම් ලෙස මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණි. මේ සඳහා නීතිමය පියවර ගැනීමෙන් පසු රු.4,472,150 ක් අරමුදල වෙත ගෙවන ලෙස එක් සමාගමකට උසාවිය මගින් 2011 වර්ෂයේදී නියෝග කර තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් එය අයකර ගැනීමට නොහැකිව තිබුණි.

4.8 **වෙනත් රාජ්‍ය ආයතන වලට ලබාදුන් අරමුදලේ සම්පත්**

---------------------------------------------------------

(අ ) රාජ්‍ය ව්‍යාවසායකයන්ගේ මූල්‍ය සම්පත් ඇතුළු අනෙකුත් සම්පත් අධීක්ෂණ අමාත්‍යාංශයේ ප්‍රයෝජනය සඳහා ලබා නොදිය යුතු නමුත් 1989 , 2000, 2001 සහ 2011 වර්ෂවල සංස්කෘතික හා

කලා කටයුතු අමාත්‍යාංශයේ සේවයට මුදාහැර තිබුණු මධ්‍යම සංස්කෘතික අරමුදලේ කාර්ය මණ්ඩලයට අයත් නිලධාරීන් 07 දෙනෙකු සමාලෝචිත වර්ෂයේදී ද අමාත්‍යාංශ සේවයේ යොදවා තිබූ අතර ඔවුන් සඳහා අරමුදල විසින් ගෙවා තිබූ දළ වැටුප් එකතුව රු.2,286,205 ක් විය.

(ආ) මධ්‍යම සංස්කෘතික අරමුදලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ 2013 වර්ෂයේදී වැඩ බැලීම සිදුකරන ලද සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ හිටපු අතිරේක ලේකම්වරයා වෙත ලබාදී තිබූ රු.110,847 ක් වටිනා නෝට්බුක් පරිගණකය ඔහු සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයෙන් 2013 සැප්තැම්බර් 03 දින සිට ස්ථාන මාරුවී ගොස් තිබුණද 2014 අගෝස්තු 25 දින වන විටත් එය ආපසු ලබාගෙන නොතිබුණි.

(ඇ) මධ්‍යම සංස්කෘතික අරමුදල සතු ඩබල් කැබ් රථයක් සමාලෝචිත වර්ෂයේ මැයි සිට සැප්තැම්බර් දක්වා සම්පූර්ණ කාලසීමාව තුළ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලයේ පරිහරණය සඳහා යොදවාගෙන තිබුණි. එම කාලයට අදාල දෛනික ධාවන සටහන් පත් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

4.9 **කාර්ය මණ්ඩල පරිපාලනය**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ තනතුරු බොහොමයක් පුරප්පාඩුවී පැවතීම හේතුවෙන් 2013 දෙසැම්බර් 31 වනවිට වැඩබැලීමේ/ රාජකාරී ඉටුකිරීමේ පදනම මත සේවයේ යොදවා සිටි නිලධාරීන් සංඛ්‍යාව 74 කි. ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබූ වැඩ බැලීමේ/ රාජකාරී ඉටුකිරීමේ දීමනාවල එකතුව රු.2,187,644ක් විය.

(ආ) ආයතන සංග්‍රහයේ විධිවිධාන වලින් බැහැරව කටයුතු කරමින් අරමුදල විසින් පුරප්පාඩු තනතුරු සඳහා දිගින් දිගටම වැඩ බැලීමේ/ රාජකාරී ඉටු කිරීමේ පදනම මත නිලධාරීන් සේවයේ යොදවා තිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට අවුරුදු 1 සිට 6 දක්වා කාලයක් එසේ රාජකාරී කරමින් සිටි නිලධාරීන් සංඛ්‍යාව 32 ක් විය.

(ඇ) 2011 දෙසැම්බර් 02 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්විය යුතු තනතුරු වෙනුවෙන් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් හෝ කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්විය යුතු වුවත් මෙතෙක් කිසිදු කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් පවත්වා නොතිබුණි.

(ඈ) තාවකාලික පදනමින් කැණීම් /සංරක්ෂණ පරීක්ෂකවරු දෙදෙනෙකු මාසික දීමනාව රු.45,000 බැගින් ගෙවීමේ පදනම මතද, ආරක්ෂක නියාමකවරුන් 48 දෙනෙකු රු.20,000 බැගින් මාසික දීමනාවක් ගෙවීමේ පදනම මතද, ආරක්ෂක උපදේශක, ආරක්ෂක විශේෂ විහිදුම් හා විමර්ශන නිලධාරී ලෙස මාසිකව රු.30,000 හා රු.25,000 බැගින් දීමනා ගෙවීමේ පදනම මතද නිලධාරීන් බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

4.10 **වාහන උපයෝජනය**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මිළගණන් කැඳවීම හා සැපයුම්කරුවන් තෝරාගැනීම විනිවිදභාවයකින් තොරව සිදුකර සමාලෝචිත වර්ෂයේදී කුලී පදනම මත වෑන්රථ 4 ක් ලබාගෙන තිබුණි. ඒ සඳහා මාසික කුළිය රු.50,000, රු. 45,000 සහ රු. 45,000 වශයෙන් ගෙවා තිබූ අතර වාහන සැපයුම්කරුවන් සමඟ කිසිදු ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ආ) මාසික කුළිය රු. 50,000 ක් වූ වෑන්රථයක් සඳහා සමාලෝචිත වර්ෂයේ ජූලි සිට දෙසැම්බර් දක්වා කාලයට කුළී වියදම ලෙස රු.546,275ක් ගෙවා තිබුණි. කුළී වාහන සඳහා මාසික අනුමක වියදම් සීමාව රු.40,000ක් වන හෙයින් එම මාස 6 සඳහා අනුමත සීමාව ඉක්මවූ කුළී වියදම රු.306,275ක් විය. තවද වාහනයේ හිමිකරු විසින් ඉටුකළ යුතු සේවා හා ටයර් දැමීම ආදිය අරමුදල විසින් සිදුකර තිබුණි.

(ඇ) අරමුදල සතුව පවතින වාහනවල ඉන්ධන පරිභෝජනය පිළිබඳ පරීක්ෂාවක් මාස 6 කට වරක්වත් සුදුසුකම් ලත් ඉංජිනේරුවරයකු මඟින් සිදුකර ගැනීමට කටයුතු කර නොතිබීමෙන් සමාලෝචිත වර්ෂය සඳහා සමස්ථ ආයතනයේ ඉන්ධන පරිභෝජන වියදම සංශෝධිත අයවැය ඇස්තමේන්තුවද ඉක්මවා සියයට 22 කින් වැඩිවී තිබුණි.

05. **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

---------------------------------------

5.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---------------------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 ජූනි 02 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබූ නමුත් මූල්‍ය ප්‍රකාශන සඳහා පාලක මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා නොතිබුණි. පාලක මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශනවල වගකීම භාරගෙන ඒවා අනුමත කළයුතු වුවද විගණනයට ඉදිරිපත් කිරීමට පෙර පාලක මණ්ඩල අනුමැතිය ලබා නොතිබුණි.

5.2 **සංයුක්ත සැලැස්ම**

---------------------

ආයතනයේ දර්ශනය හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහාත් අරමුණු කරා ළඟාවීම සඳහාත් හැකිවන පරිදි වර්ෂ 03 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් වර්ෂය ආරම්භ වීමට පෙර පිළියෙල කර නොතිබුණි. 2013 - 2016 කාලසීමාවට අදාළ සංයුක්ත සැලැස්ම සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලැබී තිබුණේ 2013 දෙසැම්බර් 03දිනය.

5.3 **ක්‍රියාකාරී සැලැස්ම**

---------------------

සංයුක්ත සැලැස්මට සමගාමී වන පරිදි ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. අරමුදල විසින් එහි එක් එක් ව්‍යාපෘතිවල ඉටුකරනු ලබන කැණීම් හා සංරක්ෂණවලට අදාල වැඩ සැලැස්ම ක්‍රියාකාරී

සැලැස්ම ලෙස ඉදිරිපත් කර තිබුණි. සමස්ත ආයතනයේම ක්‍රියාකාරීත්වය ආවරණය වන පරිදි ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5.4 **අයවැය ලේඛනමය පාලනය**

--------------------------------

(අ ) 2013 වර්ෂය සඳහා පිළියෙල කරන ලද සංශෝධිත අයවැය ලේඛනය පාලක මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2013 දෙසැම්බර් මස 03 දිනදීය. ඒ සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලැබී තිබුණේ 2013 දෙසැම්බර් 23 දින වේ. 2013 වර්ෂයේ වියදම් දැරීම පාලනයකින් තොරව සිදුකර වර්ෂය අවසානයේ සංශෝධිත අයවැය ඇස්තමේන්තුවක් සකස් කර ඊට පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබෙන බව නිරීක්ෂණය විය.

(ආ) 2013 වර්ෂය සඳහා සකස් කර තිබූ සංශෝධිත අයවැය ලේඛනය සහ 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව තථ්‍ය ආදායම හා වියදම සැසඳීමේදී සියයට 22 සිට සියයට 187 දක්වා විචලනයන් සිදුවී තිබෙන බව නිරීක්ෂණය විය. අයවැය ලේඛනය කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බව නිරීක්ෂණය වේ.

5.5 **නොවිසඳී ඇති විගණන ඡේද**

-----------------------------------

පොළොන්නරුව පූජා භූමියේ අභ්‍යන්තර ප්‍රවේශ මාර්ගය කි.මී. 1 ක් දුරට සිමෙන්ති ගල් අතුරා සංවර්ධනය කිරීමේ කාර්යය රු.38,709,100 කට කොන්ත්‍රාත් සමාගමක් වෙත පවරා ඒ වෙනුවෙන් රු.28,255,312 ක් ගෙවීම් කර තිබූ අතර 2012 මාගේ වාර්තාවෙන් පහත සඳහන් අඩුපාඩු පෙන්වා දී තිබුණද ඒ සම්බන්ධයෙන් මෙතෙක් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(අ) නිසි ප්‍රමිතියට නොමැති කොන්ක්‍රීට් ගල් ඉදිකිරීම් සඳහා යොදාගෙන ඒ වෙනුවෙන් රු.22,099,917 ක් ගෙවා තිබීම.

(ආ) ප්‍රමාණ පත්‍රය අනුව ඉටු නොකළ වැඩ වෙනුවෙන් රු.4,660,998 ක් ගෙවා තිබීම.

(ඇ) ABC ස්ථරය සියයට 40 ක් හා ගල් කුඩු මිශ්‍රණය සියයට 50 ක් අඩුවෙන් යෙදීම හේතුවෙන් මාර්ගය සමතුලිතතාවයෙන් තොරව තිබීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග නොගැනීම.

06. **පද්ධති හා පාලනයන්**

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) සේවක මණ්ඩල කළමනාකරණය
(ආ) ගිණුම්කරණය
(ඇ) සංචාරක ප්‍රවේශපත් මුද්‍රණය, අලෙවිය හා තොග පාලනය
(ඈ) ප්‍රසම්පාදනය
(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඊ) පුරාවිද්‍යා සංරක්ෂණ කටයුතු
(උ) වාහන උපයෝජනය
(ඌ) උපදේශක අධ්‍යක්ෂවරු හා ව්‍යාපෘති අධ්‍යක්ෂවරු බඳවා ගැනීම